# පුරප්පාඩු

## තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. <u>කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (පොත් තැබීම්)</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

(01) අ.පො.ස. (සා/පෙළ) විභාගයේ,

i. සිංහල භාෂාව/දෙමළ භාෂාව

ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය

iii. ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරක දී සමත් වී තිබීම.

සහ

(02) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ සියළු විෂයයන් එක් වරක දී සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

- **තනතුරට අදාල විශේෂ සුදුසුකම්;**

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා කාර්මික විද්‍යාල/තාක්ෂණික ආයතනය මඟින් පවත්වනු ලබන ගිණුම්කරණ ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සමත්වීම හෝ ඊට සමාන සුදුසුකම් පිළිගත් ආයතයකින් ලබා තිබීම.

හෝ

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගය වාණිජ විෂය ධාරාවෙන් සමත්වීම.

- **පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ;**

(අ) පරිගණක යෙදුම් භාවිතය පිළිබඳව පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි මට්ටමේ සුදුසුකම්,

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ් භාවිතය පිළිබඳව වසර 02ක පළපුරුද්ද ලබා තිබීම.

බඳවා ගනු ලබන ආකාරය : ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වැටුප් පරිමාණය : රු. 30,725 – 17x300– 35,825 (U- MN 1(IIIA)]මාසික
වයස : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතුය.

**02. <u>විද්‍යාගාර සහායක III ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

i. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සම්මාන සාමාර්ථයන් දෙකක් ද (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරනු ලබන විද්‍යාගාර සහායක තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ 2 හෝ 3 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

ii. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සම්මාන සාමාර්ථයන් දෙකක් ද (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සහිත වසරක (01) සේවා පළපුරුද්දක් තිබීම.

වැටුප් පරිමාණය : රු. 28,025 – 16x270 – 32,345 (U- PL 2(III)]මාසික
බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වයස : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

**03. <u>කම්මල්කරු III ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කම්මල්කරු තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : රු. 29,915 – 16x270 – 34,235 (U- PL 3(III)]මාසික
බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වයස : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

**04. <u>යන්ත්‍ර ශිල්පී III ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන යන්ත්‍ර ශිල්පී තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : රු. 29,915 – 16x270 – 34,235 (U- PL 3(III)]මාසික
බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වයස : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

**05. <u>පෑස්සුම්කරු III ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන පෑස්සුම්කරු තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : රු. 29,915 – 16x270 – 34,235 (U- PL 3(III)]මාසික
බඳවා ගනු ලබන ආකාරය : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි
වයස : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

**සටහන: i.** ඉහත සියලු තනතුරු සඳහා මූලික වැටුපට අමතරව, ජීවන වියදම් දීමනාව රු. 17,800/- සහ මූලික වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස අතිරේක මාසික දීමනාව (20%) හා මාසික අන්තර් දීමනාව (45%) ද ගෙවනු ලැබේ.

ii. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා හිමිකම් ලබයි.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය:** විස්තර සහිත දැන්වීම සහ අයදුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට (***http://www.itum.mrt.ac.lk***) පිවිසීමෙන් බාගත හැක. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාල සහතික වල පිටපත් සමඟ 2025.02.17 දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **<u>නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, දියගම, හෝමාගම</u>** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අදාල තනතුර සඳහන් කල යුතුය. රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙන යම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කල විට කුමන හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ,**
**තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය**
2025.01.26